A

# නිවේදනය

විසර්ජන පනත් කෙටුම්පත (2016) සම්බන්ධ කාරක සභා අවස්ථා විවාදයේදී අදාළ අමාත්‍යාංශවලින් ගරු මන්ත්‍රීවරුන්ට ලබාදෙන ප්‍රගති වාර්තා සම්බන්ධයෙන් ඊයේ දිනයේදී සහා ගර්භයේදී මතුවූ ප්‍රශ්නය පිළිවඳව නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන එවැනි වාර්තා මුද්‍රණයට වැයවන අධික වියදම අවම කරගැනීමේ පියවරක් ලෙස මුද්‍රිත වාර්තා වෙනුවට සීඩී හෝ ඩීවීඩී සංයුක්ත තැටි අනුසාරයෙන් ඒවා ලබාදීමට අදාළව 2011 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කර ඇත.

එකී තීරණය අනුව, විවිධ අමාත්‍යාංශ සහ ඒවා යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතන මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා එවනු ලබන මුද්‍රිත වාර්තා වෙනුවට සීඩි සහ ඩීවීඩි තැටි ලෙස සකසා එවන මෙන් අදාළ අමාත්‍යාංශ දැනුවත් කරන ලද අතර සීමිත මුද්‍රිත පිටපත් ප්‍රමාණයක් ලබා දෙන ලෙසද දන්වා ඇත.

පාර්ලිමේන්තු පුස්තකාලයේ තබන එකී වාර්තාවන්හි මුද්‍රිත පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සභා ගර්භයේ එක් ස්ථානයක තබා අවශ්‍ය පරිදි ඒවා ගරු මන්ත්‍රීවරුන්ට පරිහරණය කිරීමට අවස්ථාව සැලසිය හැකි බව දන්වනු කැමැත්තෙමි.

තවද, ගරු මන්ත්‍රීවරුන්ට එවැනි වාර්තා මුද්‍රිත ආකාරයෙන්ම ලබාගැනීමට අවශ්‍ය වේ නම් ඒ පිළිබඳව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කර කලින් එළඹි තීරණය ප්‍රතිශෝධනය කර අවශ්‍ය කටයුතු ලබන වසරේ සිට කිරීමට හැකි බවද සඳහන් කරමි.